# මූලික පිරිවෙන් ප්‍රථමවාර පරීක්ෂණය 2019

## සමාජ විද්‍යාව - 04 ශ්‍රේණිය. කාලය - පැය - 03

## පළමු කොටස අනිවාර්ය වේ. (A)

## (B) කොටසේ ප්‍රශ්න 4 කටත් පිළිතුරු සපයන්න.

## A කොටස

01,

I. ස්වාභාවික විද්‍යා යනු කුමක්ද?
II. සදිසා නමස්කාරයේ සදහන් නැගෙනහිර දිසාවට අයත් වන්නේ කවුරුන්ද?
III. හර්බට් ස්පෙන්සර්ගේ සමාජ පරිනාම අවධි දෙක ලියන්න.
IV. සමාජීය විද්‍යා විෂයන් දෙකක් නම් කරන්න.
V. සමාජීය විද්‍යා සම්බන්ධ උප විෂය ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න.
VI. රසයට තෘෂ්ණාව ඇති කරගැනීමෙන් ඔවුන් තුළ වූ දිව්‍යමය ලක්ෂණ ඉවත්ව ගොරෝසු ශරීර ඇතිවූ බව සදහන් සූත්‍රය කුමක්ද?
VII. අධ්‍යාපනය තුළින් බිහි කරන පුද්ගලයෙකු තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.
VIII. පෞරාණික කතෝලික ආගම අභියෝගයට ලක්කල දාර්ශණිකයන් දෙදෙනා නම් කරන්න.
IX. බෞද්ධ සමාජ ස්ථර දෙකක් නම් කරන්න.
X. ත්‍රිපිටක ග්‍රන්ථ තුළ අන්තර්ගත වන්නේ කුමක්ද?

(ලකුණු 2×10=20)

## B කොටස

02,

I. සමාජ විද්‍යාව සමාජ විද්‍යාත්මකව පහදන්න. (ලකුණු -02)
II. මැක්ස් වේබර්ට අනුව බටහිර සමාජයේ වෙනසකට ලක්කල ප්‍රධාන කරුණු මොනවාද? (ලකුණු -03)
III. බෞද්ධ පංචශීල ප්‍රතිපත්තියේ යහපත් සමාජයක් ගොඩනගන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු -02)

03,

I. සමාජ වෙනස්වීම පිළිබඳ මත ඉදිරිපත් කළ මුල්කාලීන සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු - 02)

II. පැරණි සමාජය නූතන නාගරික සමාජය දක්වා පරිණාමය වීමට බලපෑ සමාජානුබද්ධ සාදක තුනක් ලියන්න. (ලකුණු -03)

III. නවීකරණයේ මූලික ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න (ලකුණු - 05)

04,

I. ඔබ දන්නා සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. (ලකුණු -02)

II. ලාංකීය සංස්කෘතිය තුළ ඇති කතෝලික උපසංස්කෘතියක් ඇති කිරීමේදී බටහිර ජාතීන්ගේ බලපෑම විස්තර කරන්න. (ලකුණු -03)

III. පැරණි හා නූතන සමාජමය හැඩගැස්වීමෙහි ලා ඉන්දියාවට ආසන්නව පිහිටීම කොතරම් බලපෑවේදැයි නිදර්ශන දෙකක් ඇසුරින් විමසන්න. (ලකුණු -05)

05,

I. සමාජ පරිනාමය සමාජය දියුණුව කරා යන ගමනකි. බුදු දහමට අනුව දියුණුව දෙවාකාර වේ ඒ මොනවාද? (ලකුණු -02)

II. මානව ශිෂ්ටාචාරය වෙනස් කිරීමට කාර්මීකරණයේ බලපෑමට හේතු වූ කරුණු තුනක් දක්වන්න. (ලකුණු -03)

III. සාම්ප්‍රදායික කුල භේදයට එරෙහිව දක්වා ඇති බෞද්ධ ඉගැන්වීම් පැහැදිලි කරන්න. (ලකුණු -05)

# මූලික පිරිවෙන් ප්‍රථමවාර පරීක්ෂණය 2019

## සමාජ විද්‍යාව - 04 ශ්‍රේණිය. කාලය - පැය - 03

- ❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.
- ❖ ප්‍රශ්න 40 ට ලකුණු 40 ක් හිමි වේ.

01, සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයක් ලෙස බිහි වූයේ කිනම් සියවසේද ?

I. 18 වන සියවසේ
II. 19 වන සියවසේ
III. 18 වන සියවසේ මැද භාගයේ
IV. 19 වන සියවසේ මැද භාගයේ

02, සමාජ විද්‍යාවේ පියා ඔගස්ට් කොම්ට් කිනම් ජාතිකයෙක්ද?

I. බ්‍රිතාන්‍ය
II. ප්‍රංශ
III. ජර්මන්
IV. ඉන්දියානු

03, සමාජ විද්‍යාව යන පදය මුලින්ම භාවිතයට පැමිණි වර්ෂය වන්නේ?

I. 1840
II. 1769
III. 1839
IV. 1857

04, සමාජය පිළිබඳ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා නිවැරදි ක්‍රමවේදය සඳහන් පිළිතුර වන්නේ?

I. නිරීක්ෂණ , නිගමන, පර්යේෂණ
II. නිරීක්ෂණ, සම්පරීක්ෂණ, සමීක්ෂණ
III. සම්පරීක්ෂණ, නිරීක්ෂණ , නිගමන
IV. නිරීක්ෂණ, සම්පරීක්ෂණ, පර්යේෂණ

05, සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාල විෂයක් නොවන්නේ

I. භෞතික විද්‍යාවයි.
II. සමාජ විද්‍යාව.
III. දේශපාලන විද්‍යාව.
IV. ආර්ථික විද්‍යාව.

06, ඔගස්ට්කොම්ට් අනුව සමාජය පරිණාමය වීමට බලපානු ලබන මූලික හේතුව පුද්ගලයා තුළ පවතින,

I. ගතික ස්භාවයයි.
II. සංකීර්ණ ස්භාවයයි.
III. අනාත්ම ස්භාවයයි.
IV. ස්ථිතික ස්භාවයයි.

07, පැරණි සමාජය තුළ ඉස්මතුවී තිබූ ප්‍රධාන ගුණාංගයක් නොවන්නේ

I. සරල බව
II. ආරෝපිත තත්වය යි.
III. අප යන හැඟීමයි.
IV. සාධික තත්වයයි.

08, එක දේවවාදී සංකල්පය ඇති ආගම් ලෙස

I. බුදු දහම
II. හින්දු දහම
III. ඉස්ලාම් දහම
IV. සියළු ආගම්.

09, පංති ගැටුම ඇති ආර්ථික ක්‍රමයක් තුළ ධනපතියා විසින් නිර්ධනයින් පිඩාවට ලක්කරණ බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ

| | | | |
|---|---|---|---|
| I. | එමිල් ඩුර්කයිම් ය. | III. | හර්බට් ස්පෙන්සර් ය. |
| II. | කාල් මාක්ස් ය. | IV. | ඔගස්ට් කොම්ට් ය. |

10, වෙනස්වීම නිසා හටගන්නාවූ දුක බුදු දහමේ හදුන්වනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | පියෙහි විප්පයෝග දුක්ඛ ලෙසය. | III. | ජාතිපි දුක්ඛ ලෙසය. |
| II. | අප්‍රිය සම්ප්‍රයෝග දුක්ඛ ලෙසය. | IV. | විපරිණාම දුක්ඛ ලෙසය. |

11, එංගලන්තයේ මානව විද්‍යාවේ පියා ලෙෂ හදුන්වනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | රැල්ෆ් ලින්ටන්ය. | III. | ඊ. බී. ටයිලර්ය. |
| II. | රේමන්ඩ් විලියම්ස් ය. | IV. | ඩි. මැලිනොවුස්කි ය. |

12, සංස්කෘතිය යන්නට නූතන සමාජ විද්‍යාඥයින් දක්වන පර්යාය පදයක් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සමාජ වෙනස්වීම. | III. | සමාජ චර්යාවයි. |
| II. | සමාජ උරුමයයි. | IV. | සමාජ චාරිත්‍ර විධියි. |

13, දහනමවන සියවසේ බටහිර සමාජය විවිධ විපර්යාසයට ලක්වු බව ජෝර්ජ් රට්සර් දක්වයි. එහි එක් සාධකයක් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | විද්‍යාවේ වර්ධනය. | III. | කම්කරුවන් සිටීම. |
| II. | ධනපතියන් පන්තියක් සිටීම. | IV. | නිල සංවිධානයක් තිබීම. |

14, ඉංග්‍රිසි ජාතිකයන් ලංකාව යටත් කරගත් වසර කුමක්ද?

| | | | |
|---|---|---|---|
| I. | 1818 | III. | 1815 |
| II. | 1948 | IV. | 1718 |

15, බුදු දහමේ වැදගත් සමාජ ව්‍යාත්මක සංකල්පයක් ලෙස සමාජානුයෝජනය වැදගත් වේ. එය ජාතක කතාවන් තුළින් විදහා දක්වයි. එම ජාතක කථාව කුමක්ද?

| | | | |
|---|---|---|---|
| I. | ඉල්ලිස ජාතකය. | III. | සත්තිකුම්භ ජාතකය. |
| II. | අන්ධභූත ජාතකය. | IV. | සමුද්‍ර වානිජ ජාතකය. |

16, වෙසක් දිනය ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීමට විශාල වෙහෙසක් දරන ලද්දේ,

| | | | |
|---|---|---|---|
| I. | ආනන්ද කුමාරස්වාමීය. | III. | මොහිදින් බෙග්ය. |
| II. | ලක්ෂමන් කදිරගාමර්ය. | IV. | මර්ෂලින් ජයකොඩි ය. |

17, පුද්ගල සමාජානුයෝජනය සිදුවන මුල්ම කාරකය වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | පාසලයි. | III. | පවුලයි. |
| II. | පන්සලයි. | IV. | පොලීසියයි. |

18, සමාජ පැවැත්ම උදෙසා සාරධර්මවල වැදගත්කම බුදු දහම දක්වන බෞද්ධ සූත්‍රය වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සිගාලෝවාද සූත්‍රය | III. | පරාභව සූත්‍රය |
| II. | කරණීය මෙත්ත සූත්‍රය | IV. | කාලාම සූත්‍රය |

19, සාමණේර භික්ෂූන් වහන්සේලාගේ පාලනය සඳහා බුදුන් වහන්සේ අනුදැන වදාල විනය නීතිය වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | දස සිල්ය. | III. | පන්සිල්ය. |
| II. | උපසම්පදා සිල්ය. | IV. | සේඛියා ය. |

20, චේතනාහං භික්ඛවේ කම්මං වදාමි මේ තුළින් සමාජ විද්‍යාවට වැදගත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සමාජ සම්බන්දතා | III. | සමාජ පාලනය |
| II. | සමාජ ක්‍රියා | IV. | සමාජ සංස්ථා |

21, සමාජ චාරිත්‍ර වාරිත්‍ර වලින් නිති රීති පද්දතිය වෙනස් වීමේ ප්‍රධානතම ලක්ෂණය වනුයේ,

| | | | |
|---|---|---|---|
| I. | පිළිපැදීමට අපහසු වීමයි. | III. | පහසුවෙන් ඉගනීමට හැකිවීමයි. |
| II. | ලේඛනගතව පැවතීමයි. | IV. | දඩුවමකට යටත් වීමයි. |

22, ප්‍රොසෙස්තන්ත්‍ර ආචාර ධර්ම හා ධනවාදයේ හරය යන කෘතිය රචනා කළේ කවුද?

| | | | |
|---|---|---|---|
| I. | එමිල්ඩුකයිම් | III. | මැක්ස්වෙබර් |
| II. | ජොන්තැල්වින් | IV. | ඔගස්ට්කොම්ට් |

23, සමාජ විද්‍යාව සියළුම සමාජීය විද්‍යාවන්ගේ මව බව පවසයි. ඒ බව පැවසූ විද්‍යාඥයා කවුරුන්ද?

| | | | |
|---|---|---|---|
| I. | හොබ්හවුස් | III. | ඇන්තනි ගිඩ්න්ස් |
| II. | ජේ විල්කින්ස් | IV. | ස්ටුවට් මිල් |

24, බුදු දහම මූලික වශයෙන් දාර්ශනික ස්භාවයක් පෙන්නුම් කළද සමාජ විද්‍යාත්මක පදනමක් ඇති බව දක්වන දාර්ශනිකයෙකු වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | නන්දසේන රත්නපාල | III. | හර්බට් ස්පෙන්සර්ය |
| II. | ෆර්ඩිනන් ටෝනිස්ය. | IV. | ඊ.බී. ටයිලර්ය. |

25, ආවෘත සංස්කෘතියට අයත් වන්නේ ,

| | | | |
|---|---|---|---|
| I. | සිරිත් හා විරිත්ය. | III. | නිති රීති |
| II. | සමාජ සංවිධානය. | IV. | අධිකරණය හා පොලීසිය. |

26, දෙවෙනි රාජසිංහ රජු සමග එක්වී පෘතුගීසින් පලවා දැමූ වර්ෂය වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | 1802 | III. | 1638 |
| II. | 1677 | IV. | 1796 |

27,ලිච්ඡවී රජ දරුවන් රාජ්‍ය පාලනයේදී අනුගමනය කළ සමගිව රැස් වීම සාමූහිකව කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | දස රාජ ධර්මවලටය. | III. | සතර සංග්‍රහ වස්තු වලටය. |
| II. | සප්ත අපරිහානිය ධර්මවලටය. | IV. | ත්‍රිවිධ පුන්‍යක්‍රියාවලටය. |

28,යහපත් දිවි පැවැත්ම අර්ථවත් කරනු ලබන ආර්ය අෂ්ටාංගික මාර්ග අංගය වන්නේ,

| | | | |
|---|---|---|---|
| I. | සම්මා සති වේ. | III. | සම්මාසංකප්ප වේ. |
| II. | සම්මා සමාධි වේ. | IV. | සම්මා ආජීව වේ. |

29, වෙළඳ ප්‍රවාහනයට කළු ගඟ, ගිං ගඟ, බෙන්තර ගඟ හරහා විශාල පාලම් ඉදිකළේ කිනම් ජාතිකයින්ද?

I. පෘතුගීසි
II. ඉංග්‍රීසි
III. ප්‍රංශ
IV. ලංදේසි

30, ක්‍රි.ව. 10 වන සියවසේ දී වෙනස්කම් රැසක් සිදුවූ ප්‍රධාන ආක්‍රමණය වන්නේ,

I. පෘතුගීසි ආක්‍රමණය.
II. ලංදේසි ආක්‍රමණය.
III. දකුණු ඉන්දීය ආක්‍රමණය.
IV. ඉංග්‍රීසි ආක්‍රමණය.

31, සමාජ ප්‍රශ්න හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ ,

I. එක් පුද්ගලයෙකුට දැඩි බලපෑම් සිදුවීම.
II. කිහිපදෙනෙකුට බලපෑම් සිදුවීම.
III. පවුල් සංස්ථාවට බලපෑම් සිදුවීම.
IV. සමාජයේ වැඩි දෙනෙකුට අයහපත් ලෙෂ බලපෑම් සිදුවීම.

32, සමාජ ප්‍රශ්නයක් ලෙස මින් සැලකිය නොහැක්කේ කුමක්ද?

I. අපරාධ
II. ස්වාභාවික මරණ
III. අපචාර
IV. සියදිවිනසාගැනීම

33, ආත්ම ඝාතනය යන කෘතීය රචනා කළේ කවුරු විසින්ද?

I. මාර්ටින් ලූතර් විසින්ය.
II. එමිල් ඩුර්කයිම් විසින්ය.
III. රැග්නාර් නර්ක්ස් විසින්ය.
IV. හර්බට් ස්පෙන්සර් විසින්ය.

34, දුප්පත් බව නැති කිරීම සඳහා ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන උපාය මාර්ගය වන්නේ?

I. සමෘද්ධි ව්‍යාපාරයයි.
II. රක්ෂණාවරණය ලබාදීමයි.
III. විශ්‍රාම වැටුප් ගෙවීමයි.
IV. රෝහල් ඉදිකිරිමයි.

35, ලංකාවේ ජනගහනයෙන් ළමා ජනගහනය ලෙස සැලකෙන්නේ වයස අවුරුදු කීය ඉක්මවූවන්ද?

I. 3-10 ත් අතර
II. 5-10 ත් අතර
III. 5-14ත් අතර
IV. 6- 14 ත් අතර

36, පහත සඳහන් සාදක ඇතුරින් සමාජ ප්‍රශ්නයක් ඇතිවීමට බලපාන හේතු සාදක ඇතුළත් පිළිතුර තෝරන්න.

A – නූගත්කම
B – නීති රීති පිළිබඳ නොදැනුවත්කම
C – ආර්ථික සහයෝගීතාව
D- මානසික අසහනය

I. A,B,C
II. A,C,D
III. A,B,D
IV. B,C,D

37, සමාජයක ඇතිවන ගැටුම්කාරී තත්වය බලපානු ලබන්නේ

I. පවුල් සංස්ථාවට පමණි.
II. පුද්ගලයෙකුට පමණි.
III. සමස්ත සමාජයටමය.
IV. කිහිපදෙනෙකුට පමණි.

38, අනුරාධපුරය හා පොළොන්නරුව රාජධානි කේන්ද්‍ර කරගත් මෙම වාරි ශිෂ්ටාචාරය ලොව කිසිදු රටක දක්නට නොමැති බව සදහන්කළ සමාජ විද්‍යාඥයා,

I. රැග්නාර් නර්ක්ස්
II. හර්බට් ස්පෙන්සර්
III. රැල්ෆ් ලින්ටන්
IV. කේ විට් ෆෝගල්

39, බුදු සසුනේ පැවැත්ම සදහා වඩාත්ම වැදගත් සම්බන්ධතාවය වන්නේ,

I. මව්පිය දූ දරු සබධතා
II. ගුරු- සිසු සබඳතා
III. අඹු -සැමි සබඳතා
IV. ගිහි - පැවිදි සබඳතා

40, ශ්‍රී ලංකා සමාජය බටහිර ජාතීන්ගේ බලපෑමට ලක් වුයේ 16 වන ශතවර්ෂයේ,

I. පෘතුගීසින්ගේ පැමිණීමත් සමගය
II. ලංදේසින්ගේ පැමිණීමත් සමගය
III. ප්‍රංශ ජාතීන්ගේ පැමිණීමත් සමගය
IV. ඉංග්‍රිසින්ගේ පැමිණීමත් සමගය